12-02-2019 උදෑසන මුරලි ඕම් ශාන්ති බාප්දාදා මධුබන්

**සාරය:** සුමිහිරි දරුවනි, ගුරුවරයා අශාරීරිකය. එමනිසා, ඔහු සිහි කිරීමට උත්සාහ කළ යුතුය. පියාව සිහි කිරීම තුළින් ඔබගේ විභාගය ඔබ අවසන් කරනා අතර, ඉන්පසු නිවස වෙත යනවා ඇත.

**ප්‍රශ්නය:** දරුවන්, සිහි කිරීම සඳහා උත්සාහ දැරිය යුතුය. එමනිසා, ඔබ රැවටිය නොයුත්තේ කුමකින්ද?

**පිළිතුර:** ඔබ ජීවයේ දර්ශනයක් දකිනා විට ඔබ දීප්තිමත් එළියක් දකී. එයින් කිසිම ඵලක් නැත. දර්ශනය දැකීමෙන් හෝ බාබාගේ දෘෂ්ටි ලැබීමෙන් ඔබට ඔබගේ පාපයන් දුරුකරගත හැකි නොවේ. එමගින් ඔබ තවදුරටත් නොරැවටෙන්න. ස්මරණය සඳහා උත්සාහ කරන්න. ඔබගේ උත්සාහයෙන් පමණයි ඔබට කර්මාතීත් තත්ත්වය ලබා ගැනීමට හැකි වන්නේ. ඔබට බාබාගේ දෘෂ්ටි දුන් විට තමන් පාරිශුද්ධ වනවා යැයි කිව නොහැක. ඔබ උත්සාහ කළ යුතුය.

ඕම් ශාන්ති. ආධ්‍යාත්මික පියා මෙහි හිඳ ඔබට තේරුම් කරයි. ඔහු ඔබට යෝගාව පිළිබඳව අවබෝධ කරදෙන අතර ඔබට එය උගන්වයි. යෝගාව ලොකු දෙයක් නොවේ. ළමයින් ඉගෙන ගන්නා විට ඔවුන් අනිවාර්යෙන්ම ගුරුවරයා සමග යෝගාව තබාගෙන ඇත. ඉතා උසස්ම ගුරුවරයෙක් ඔවුන්ට, තමාට සමාන කිරීමට උගන්වන බව ඔවුන් සිතයි. ඔබට එම අධිෂ්ඨානය සහ අරමුණ ඇත. ඔබ ඒ ආකාරයේ වූ පන්ති කාමරයක සිට ඉගෙන ගනිමින් සිටී. එහි වූ ගුරුවරයා ඔබට යෝගා කිරීමට කිව යුතු නැත. ඔබ ඉබේම එහි ගුරුවරයා සමඟ යෝගාව තබා ගනී. ඔහු ඔබට මුළු දවසම උගන්වන්නේ නැත. ඔබ එලෙස උපතින් උපත ඉගෙන ගත්තා පමණක් නොව එම පුහුණුව ද ඔබ තුළ ඇත. මෙහි ඔබේ පුහුණුව සම්පූර්ණයෙන්ම අලුත්ය. මොහු ශාරීරික ගුරුවරයෙක් නොවේ. මොහු ඔබ අවුරුදු 5000කට වතාවක් හමුවන්නා වූ අශාරීරික ගුරුවරයා වේ. ඔහු ම කියයි මම ඔබගේ ශාරීරික ගුරුවරයා නොවේ. එමනිසා තමයි මෙම මතකය ඔබ තුළ රැඳෙන්නේ නැත්තේ. ඔබ ඔබව ජීවයක් ලෙසත් උත්තරීතර පියා, උත්තරීතර ජීවය, ගුරුවරයා ඔබට උගන්වන බව සිතිය යුතුය. ඔබගේ විභාගය සමත් වන තුරු ඔබ ඔබගේ ගුරුවරයාව මතක් කළ යුතුය. ඔහුව සිහිපත් කිරීම තුළින් ඔබ විභාගය සමත්වන අතර ඔබගේ නිවස කරා ඔබ ගමන් කරනවා ඇත. ඔබගේ විභාගය අවසන් වීමත් සමඟම මෙම නාටකය ද අවසන් වේ. තම ජීවය තුළ පටිගත වී ඇති උපත් 84ක චරිතය රඟපෑ යුතු බව දරුවන් වන ඔබලා දනී. ඔබ මෙය දැන් දන්නේය. අවසානයේ ඔබ එහි සිටින විට ඔබට මෙය මතක් නොවේ. ඔබ සියලු ඥානය ලබන්නේ මෙහිය. ගුරුවරයා ඔහු විසින්ම මෙහි හිඳ ඔබට මේ සියලු ඥානය පැහැදිලි කරනා විට ඔබ දිගින් දිගටම මෙය තේරුම් ගත යුතුය. අනිවාර්යෙන්ම ඔබ ස්මරණයෙහි ද රැඳී සිටිය යුතුය. පරම පියා නැවත නැවතත් කියයි 'මන්මනභව්'. 'මන්මනභව්' හි තේරුමක් තිබේ. දරුවන් මෙම වචනය නිවැරදි යැයි තේරුම් ගනී. පියා කියයි මා සිහි කරන්න, එවිට ඔබගේ පව් ගෙවී යනවා අත. මෙයට යම් කාලයක් ගත වේ. ඔබ ඔබව විනිශ්චය කළ යුතුය. අධ්‍යාපනයක ඉතිහාසය, ගණිතය, විද්‍යාව ලෙස බොහෝ විෂයන් තිබෙන බවත්, කෙතරම් මට්ටමකින් තමන් සමත්වෙනවාද කියාත් ළමයින් වටහා ගනී. ඉතින්, ඔබ ඉතා ඉහළ ලකුණු වලින් සමත් වෙන්න යන බව ඔබ බුද්ධිය තුළ තිබේ. බාබා අමතක නොකරන බවට තමන් වගබලා ගත යුතුය. බාබා, මායා අපට නිරන්තරයෙන්ම ඔබව අමතක කරන්න සලස්වයි. අපට බොහෝ සේ මායාගෙන් කරදර ඇත. අපට බොහෝ නරක සිතිවිලි ඇත. තේරුම් නොගැනීම නිසා, බාබා, මෙයින් පාපයන් ඇති නොවේ නේද? කියා ඔවුන් අසයි. අපට එවන් නරක සිතිවිලි එනවා. කාව හෝ දුටු විට මෙහෙම දෙයක් කළ යුතුයි කියා සිතනවා. එහි පාපයක් නැහැ නේද? පරම පියා කියයි නැත. පවක් ඇතිවන්නේ භෞතික ඉන්ද්‍රියන් මගින් ඒවා ක්‍රියාවට නැංවූ විටය. බාබා නැවත නැවතත් ඔබට දිගටම තේරුම් කරයි. ඔබ දරුවන්ට ඥානය ඇත. ඔබ දන්නවා ඇයි විෂ්ණු සහ ක්‍රිෂ්ණාට ස්ව දර්ශන චක්‍රය ලබා දී ඇත්තේ කියා. ඔවුන් විසින් අකාසුර් සහ බකාසුර් යන යක්ෂයන්ව විනාශ කරන අයුරු ඔවුන් නිර්මාණය කර ඇත. නමුත් එලෙස කිසිවෙකු ඝාතනය කිරීම පිළිබඳව කියා දෙයක් නැත. එහිදී සිදුවන්නේ පාපයන් කපා හැරීමකි. ශිව බාබා ද ස්ව දර්ශන චක්‍රධාරී ලෙසින් හඳුන්වයි. ඔහුට මුළු චක්‍රය පිළිබඳවම ඥානය ඇත. ජීවය, පියාගෙන් මෙම ලෝක චක්‍රය කෙලෙස කැරකේද පිළිබඳ වූ ඥානය ලබාගෙන ඇත. ස්ව දර්ශන චක්‍රය ඔබ තුළ තබාගෙන තමන්ගේ පාපයන් කපා හැරිය යුතුය. ඥානය උකහා ගන්න, එමෙන්ම පියා සිහි කරන්න. පියා සිහි කිරීම තුළින් පමණයි ඔබගේ පාප කැපී යන්නේ. ඔබ සියලු දෙනාම ස්ව උත්සාහයක් කළ යුතුය. බාබා අසුන්ගෙන ඔබට දෘෂ්ටි ලබා දෙමින් ඔබගේ පාපයන් කපා හරිනවා නොවේ. බාබා හිඳගෙන එම කාර්යය කරන්නේ නැත. ඔබ සියලු දෙනා දෙසම ඔහු බලා සිටී. ඔහු ඔබ දෙස බැලීමෙන් හෝ ඔබට ඥානය දීමෙන් ඔබගේ පාප ඉවත් නොවේ. පියා ඔබට

මාර්ගය පෙන්වයි මෙය මේ ආකාරයෙන් කරන්න, එවිට ඔබගේ පාපයන් ඉවත්ව යනු ඇත. ඔහු ඔබට ශ්‍රීමත් ලබා දේ. හොඳයි, උදාහරණයක් ලෙස කියනවානම්, පියා පැමිණි විට ඔබව ජීවයන් ලෙස සලකා ඔහු ඔබ දෙස බලා සිටිනවා. මේ තුළින් ඔබගේ පව් ඉවත් වන්නේ නැත. පාපයන් කපා හැරෙන්නේ ඔබගේ ස්ව උත්සාහයෙනි. පියා එලෙස හිඳ මෙය කළේනම්, මෙය ව්‍යාපාරයක් බවට පත්වේ. පියා පැහැදිලි කරයි ඔබට ඔබගේ ශාරීරික පියා එලෙස සිහිකළ හැකිය. මෙම පියා ඔබට ශ්‍රීමත් ලබා දේ. ඔබ ඔබගේ ස්ව උත්සාහය කළ යුතුය. සන්‍යාසී කෙනෙකුගේ, මුනිවරයෙකුගේ දෘෂ්ටිය ලබා ගත්තොත් ඇති යැයි බොහෝ අය සිතයි. කෙසේවුවත්, ඔවුන්ගේ කරුණාව සහ ආශීර්වාදය අත්දැකීමෙන් පසුවද මිනිසුන් දිගටම වැටේ. ඔවුන්ට කවරාකාරයේ කරුණාවක් ඇත්ද? ඔවුන් සිහිකරනු ලබන්නේ ඔවුන්ගේ බ්‍රහ්ම මූලධාතුව පමණයි. පියා ඔබට පැහැදිලි මාර්ගය පෙන්වයි. ඔහු කියයි මේ මේ දෑ කරන්න. අප අශරීරිකව පැමිණ, අශරීරිකව නිවස වෙත ආපසු යයි කියා ඔබ ගායනා කරයි. මෙය අදාල වන්නේ මේ කාලයටයි. පියාගේ ප්‍රකාශයක් එවිට භක්තියේ මාර්ගයට අවශ්‍ය වේ. පියා කියයි දැන් මා සිහි කරන්න, ඔබගේ පාපයන් ඉවත්වනු ඇත. පියා ඔබට ශ්‍රීමත් ලබා දේ. මෙය මෙම නාටකයේ ඔහුගේ චරිතය වේ. ඔබට එය ඔහුගේ උදව්වක් ලෙස කිව හැක. ශ්‍රීමත් මතක්වන්නේ නාටකයට අනුකූලවයි. පියා ඔබට මාර්ගය පෙන්විය යුතු වේ. ඔහු කියයි ඔබ ජීවයන් ලෙස සලකන්න. ඔහු ඔබට උදව්වෙන් ඔබගේ කර්මතීට් තත්ත්වයට ගෙන එයි කියා දෙයක් නැත. එයට කාලයක් ගත වේ. ඔබ බොහෝ උත්සාහ ගත යුතුය. ඔබට ජීවයක් ලෙස සැලකීමට හොඳ පුහුණුවක් තිබිය යුතුය. ඇත්තෙන්ම මච්චරුන්ට ගොඩක් කාලය ඇත. පිරිමින් ඔවුන්ගේ රැකියාවන් කෙරෙහි සැලකිල්ලක් දක්වයි. ඔබ පියාව සිහිකරන අතරතුර ඔබගේ ලොතරැයිය දිනාගත යුතුය, එයින් බැඳී ඇති සියලුම මලකඩ ඉවත්වේ. ඔබ සිතනවා මේ මේ කෙනා හොඳ උත්සාහ දරන්නෙක් කියා, මන්ද, ඔහු වාර්තාවක් පවත්වා ගනී. මෙලෙස භක්ති මාර්ගයේදී ඔවුන් පැය දෙක තුන හිඳගෙන සිටී. විශ්‍රාමික අවදියේ සිටිනා අය ඔවුන්ට ආවේනික ගුරුන් ආදිය තෝරා ගනී. එසේ වුවත් ඔවුන් දේවතාවරුන් සිහිපත් කරනා තරමට ඔවුන්ගේ ගුරුන්ව සිහිපත් නොකරයි. කෙසේවෙතත්, දේවතාවරුන්ව සිහි කිරීමට අවශ්‍ය නැත. එලෙසම ඔවුන් කවමදාවත් උගන්වන්නේ ද නැත. මෙය ඔබට අළුත් දෙයක් නොවේ. දරුවෙනි, එලෙසම මෙය අවුරුදු සිය දහස් ගණනක කරුණකුත් නොවේ. පියා පැමිණෙන්නේ ස්ථාපනයේ හා විනාශයේ කාර්යය ඇති විටය. දරුවන් දන්නවා විනාශය සෑම කල්පයකදීම සිදුවන බව. එය පෙර කල්පයේදීද සිදුවුණා. ඔබ දිගටම ලියයි, මෙය අවුරුදු 5000කට පෙර ද සිදුවුණා. පියා සෙවීම සඳහා ඔබට පෙන්වන්නා වූ මාර්ගය අළුත් දෙයක් නොවේ. පියා කියයි මා සෑම කල්පයකදීම පැමිණ මාර්ගය පෙන්වමි. ඔබ දරුවන් දන්නවා ඔබගේ රාජධානිය ස්ථාපනය වෙමින් පවතින බව. ඔබ අදහන්නා වූ දේවතාවන්ගේ රාජධානිය නැවත සිදුවෙමින් පවතී. අවුරුදු 5000කට සැරයක් වූ කාල චක්‍රය දිගටම කැරකෙමින් පවතී. මිනිසුන්ගේ මනස ව්‍යාකූල වේ. ඔවුන් සියලු දෙනාම මායාගේ උපදෙස් අනුගමනය කරයි. ඔවුන් රාවන් පිළිස්සීමේ තේරුම නොදනී. ඔබගේ නම 'ස්වදර්ශන චක්‍රධාරී' වේ. ඔබගේ අරමුණ හා ඉලක්කය ඔබ ඉදිරියේ ඇත. බාබා ඔහුගේ ඥානය ඔය ජීවයන්ට ලබා දී ඇත. නාටකයේ කාල චක්‍රය අවසානය කරා ලංවෙද්දී පියා පැමිණ ඔබට ඥානය ලබා දේ. පියා ඔහුම පැමිණ මෙම ක්‍රියාවන් ඔබට උගන්වයි. අප පාපකාරී මාර්ගයේ ගමන් කිරීමට පටන් ගන්නවාත් සමඟම රාත්‍රිය ඇරඹෙන අතර අප දිගටම පහත වැටීමට පටන් ගනී, සතුට දිගින් දිගටම අඩු වේ. ඔබට තම පියාගේ බුද්ධියේ තියෙන ආකාරයටම මුළු චක්‍රයම ඔබගේ බුද්ධියේ ඇත. කෙසේවෙතත්, ඔබ පාරිශුද්ධ වීමට උත්සාහ කළ යුතුය. මේ නිසා තමයි ඔබ බාබාට කතා කරන්නේ බාබා, පැමිණ අපිරිසිදු අපව පිරිසිදු කරවන්න. ඉතින්, ඥානය අවශ්‍ය වේ. ඔබ සාමාන්‍ය මනුෂ්‍යයාගේ සිට දේවතා මට්ටමට මාරු විය යුතුය. දරුවෙනි, පියා ඔබට රාජයෝගා ඉගැන්වීමට පැමිණ ඇත. අන් කිසි කෙනෙක් මෙය ඉගැන්වීමට නොදනී. ඔබ පාරිශුද්ධකරු වන පියාට කතා කර කියයි බාබා, පැමිණ අපව පවිත්‍ර කරවන්න! ඔබලා දැන් පාරිශුද්ධ හා පුන්‍යවන්ත ජීවයන් බවට පත්වෙමින් සිටිනවා. ලෝක ඉතිහාසය හා භූගෝලය නැවත සිදුවෙමින් පවතී. මේවා ඉතා ගැඹුරු කාරණා වේ. මිනිසුන් ජීවයවත් උත්තරීතර ජීවයවත් නොදනී. ජීවයක් යනු කුමක්ද හා එහි කොටස් මොනවා දැයි පියා පමණක් ඔබට පවසයි. සියලුම දෑ ජීවයේ පටිගත වී තිබෙන්නේ කෙසේද යන්න ඇත්තටම පුදුමයකි. ඔබට මෙය ඇසුණු විගසම ඔබගේ හිරිගඩු පිපෙනවා. සමහරුන්ට ජීවයේ දර්ශනය ඇත. ඔවුන් එළියක් දකී. කෙසේවෙතත්, එහි ඇති ඵලය කුමක්ද? මෙහි ඔබ යෝගාවෙහි සිටිය යුතුය. මිනිසුන් යම් දර්ශනයක් දැකීමෙන් ඔවුන්ට නිදහස ලැබෙන බවත් ඔවුන්ගේ පව් ඉවත්වන බවත් සිතයි. මෙයින් ඔවුන් තවදුරටත් රැවටේ. පියා දිගින් දිගටම ඔබට සියලු දේ පැහැදිලි කරයි. ඔහු කියයි මම ඔබට ගැඹුරු දේ පවසමි. ඔබට මුළු ලෝක චක්‍රය පිළිබඳවම වූ ඥානය ඔබගේ බුද්ධියේ ඇත. පහසුවෙන් බාබා හා ලෝක චක්‍රය ගැන හිතන්න. එලෙසම ගුරුවරයා හා ඥානය පිළිබඳව සිහි කරන්න. නාටකයට අනුව ඔබ ඔහුව සිහි කිරීම තුළින් කර්මාතීත් තත්ත්වයට පත් වේ.

ඔබ අශරීරිකව පැමිණියා සේම අශරීරිකව යා යුතුය. ඔබ ඔබේ දිව්‍යමය සංස්කාරයන් ඔබ සමඟ ගෙන යයි. එහි ඔබට ඥානය නොතිබේ. මෙය හඳුන්වනු ලබන්නේ පහසු සිහි කිරීම යනුවෙනි. මිනිසුන් යෝගා යන වචනය අසා පැටලීමට පත් වේ. ඔවුන් හතයෝගීන්ය. පියා පමණයි ඔබට පහසු යෝගාව උගන්වන්නේ. ගීතාවේ දෙවියන් පහසු යෝගා ඉගැන්වූවා කියා ඔබ මීට පෙර අසා තිබුණා. කෙසේවෙතත්, ඔබ ඔහුව දැන සිටියේ නැහැ. 100%ක්ම වූ වැරදි අවබෝධය නිසා, මිනිසුන් අපවිත්‍ර වී ඇත. මෙහි ගැණිය නොහැකි තරම් මාර්ගෝපදේශයන් ඇත. ගීතා කෘතිය අදාලවන්නේ ගෘහ වාසීන්ටයි. පෙර ඔබගේ මෙම මාර්ගය පාරිශුද්ධ පවුල් මාර්ගය වුණි. නමුත් දැන් එය අපවිත්‍ර පවුල් මාර්ගය වේ. එය දැන් නැවතත් පාරිශුද්ධ විය යුතුය. පියා සැමදාටම පාරිශුද්ධය. ඔහු ඔබට ශ්‍රීමත් දිමට පැමිණේ. පියා කියයි මේ කාලයේ සියලු දෙනාම තමෝප්‍රධාන් වී ඇත. පෙර ඔබ සතෝප්‍රධාන්ව සිටියේය. අපි ද පළමුව සතෝප්‍රධාන්ව සිටි නමුදු ඉන් පසුව තමෝප්‍රධාන් බවට පත් විය. පාප්වහන්සේ හෝ පූජකවරයෙක් වේවා, එන ඕනෑම කෙනෙක් පළමුව සතෝප්‍රධාන්ව සිටියා. ඉන්පසු, යම් යම් දෑ එකතු වනවාත් සමඟම මුළු ගසම තමෝප්‍රධාන් වුණා. මුළු වෘක්ෂයම දැන් සම්පූර්ණ දිරාපත් තත්ත්වයේ ඇත. ඔබ සතෝප්‍රධාන්ව සිටි බවත් දැන් තමෝප්‍රධාන් වී ඇති බවත් ඔබ දනී. ඔබ දැන් නැවත සතෝප්‍රධාන් විය යුතුයි. නාටකයට අනුව පිළිවෙලින් ඔබ ඒ තත්ත්වයට පත් වේ. තමාගෙන් ගස මතුවන්නේ කෙසේද කියා බීජය දනී. මානව ලෝක ගස පිළිබඳව පියා පමණක් ඔබට දැනුම ලබා දේ. ඔහු උයන්පල්ලා වේ. ඔහු දන්නවා ඔහුගේ උද්‍යානය ඉතා අලංකාරව තිබූ බව. ඉතාමත් අලංකාර සහ ශ්‍රේෂ්ට, දෙවියන්ගේ උද්‍යානයක් තිබිණි. නමුත් එය දැන් යක්ෂයින්ගේ උද්‍යානයක් වී ඇත. රාවන්ගේ රාජධානිය සාතන් කියා හැඳින්වීය. සෑම තැනම ප්‍රචණ්ඩත්වය ඇත. ඔවුන් දැනටම න්‍යෂ්ටික බෝම්බ සමඟ සූදානම්ව සිටී. සියලු දෙනාම මෙය දන්නවා. මේ දේවල් ඇත්තේ ගබඩා කර තැබීමට නොව. අනිවාර්යෙන්ම විනාශය සිදු විය යුතු බව සෑම කෙනෙක්ම දනී. මෙය ඉතා පැහැදිලිය. කොහොමනමුත්, මහාභාරත යුද්ධය සිදුවුණ බවත් පාණ්ඩවයින් පමණක් බේරුණු බවත් පසුව, ඔවුන්ද දැවී ගිය බවත් ඔවුන් පෙන්වයි. කෙසේවෙතත්, මෙයින් කිසිම ප්‍රතිඵලයක් නැත. මෙම නාටකය දෛවෝපගත වූවක් බව පියා පැහැදිලි කරයි. භාරතය පැහැරගත් අතර දැන් එය ආපසු දෙමින් සිටී. අවසානය දක්වාම ඔවුන් එලෙස දේවි. ඔබ දන්නවා සියලු දේ විනාශයේදී විනාශ වී යන බව. අපේ රාජධානිය තිබුණු කල වෙන රාජධානියක් තිබුණේ නැහැ. ඉතිහාසය නැවත ආ යුතුය. භාරතය නැවත ස්වර්ගය වනු ඇත. එහි ලක්ෂ්මී සහ නාරායන්ගේ රාජධානිය වනු ඇත. එහි අන් කිසි දේශයක් ගැන සඳහන් නොවේ. එය දැන් කලි යුගයේ අවසානයයි. ඉන්පසු ලක්ෂ්මී සහ නාරායන්ගේ රාජධානිය පැමිණේ. අප නැවත එලෙස වනු ඇත. පියා පවසයි මා ඔබට රාජයෝගාව ඉගැන්වීමට පැමිණ ඇත. ඔබ බොහෝ වාර ගණනක් එම අධිපතියන් බවට පත්ව ඇත සෑම කල්පයකදීම. මුළු ලෝකයම ඔවුන්ගේ රාජධානිය බවට පත් වී තිබිණ. ඔවුන් බොහෝ ඥානවන්තව සිටියහ. එහි ඔවුන්ට අනුශාසකයන්ගෙන් අනුශාසනා ලබා ගැනීමට අවශ්‍ය නැත. මෙම නාටකය නිශ්චය වූවකි, එය නැවත සිදුවෙයි. ඔවුන් ක්‍රිෂ්ණාගේ දේවස්ථානය, 'සතුටු භූමිය' ලෙස හඳුන්වයි. ශිව බාබා පැමිණ සතුටු දේශය ස්ථාපනය කරයි. ක්‍රිස්තු පූර්ව 3000දී භාරතය ස්වර්ගය වූ බව ඔවුන්ම කියයි. ප්‍රථමයෙන් එහි එක් ආගමක් තිබුණු අතර පසුව අනෙක් ආගම් පැමිණියා. දරුවෙනි, බාබා ඔබට රාජධානියක් දෙන අයුරු පිළිබඳව ඔබ පුදුම විය යුතුය. පියා පැමිණ ඔබට භක්තියේ ඵලය ලබා දේ. එය ඉතාමත් පහසුය. කොහොමනමුත්, ඔවුන් කරනු ලැබූ උත්සාහයෙන් පෙර කල්පයේදී තේරුම් ගත් අය, තමන් කරන උත්සාහයට අනුව අංක පිළිවෙලට නැවතත් තේරුම් ගනී. අච්චා.

සුමිහිරි, ආදරණීය, බොහෝ කාලයක් තිස්සේ නැති වී සිට මේ දැන් හමු වුණු ඔය දරුවන්ව ඔබගේ මව, පියා, බාප්දාදා සෙනෙහසින් සිහිපත් කර සුබ උදෑසනක් ප්‍රාර්ථනා කරයි. ආධ්‍යාත්මික පියාගෙන් ආධ්‍යාත්මික දරුවන්ට නමස්කාර.

**ධාරණය සඳහා සාරාංශය:**

1. ස්ව දර්ශන චක්‍රය යොදා ගනිමින් ඔබගේ පව් කපා ගන්න. ඔබ ඔබගේ භෞතික අවයව තුළින් පාපකාරී ක්‍රියා කිරීමෙන් වැලකී සිටීමට ප්‍රවේසම් වන්න. ඔබ කර්මාතීත් තත්ත්වය ලබා ගැනීමට අවශ්‍ය උත්සාහය දරන්න.
2. දර්ශනයක් ලබා ගැනීම සඳහා අවශ්‍යතාවයක් නොතබා ගන්න. දර්ශන ලැබීමෙන් මුක්තිය ලැබෙන්නේවත් පව් කැපී යන්නේවත් නැත. දර්ශනයක් තුළින් කිසිම ඵලක් නැත. බැඳී ඇති මලකඩ ඉවත් කළ හැකි වන්නේ පියා සහ ඔහුගේ ඥානය සිහි කිරීම තුළින්ය.

**වරදානය:** ඔබ, තමන් උපකරණයක් බව සලකා, නිෂ්ඵල සිතිවිලි සහ නිෂ්ඵල ආකල්පයකින් නිදහස්ව සිට, ලොවට යහපත සලසන්නෙක් වේවා

'ලොවට යහපත සැලසීමේ කාර්යයට, මා උපකරණයකි.' මෙම වගකීමේ අවධානය පත්වාගන්න, එවිට ඔබට කිසි විටෙක, තමන් හෝ අන් අය කෙරෙහි කිසිදු නිෂ්ඵල සිතිවිල්ලක් හෝ නිෂ්ඵල ආකල්පයක් නොතිබෙයි. වගකීම් ඇති ජීවයන්ට, යහපත නොගෙනෙන එකදු සිතිවිල්ලක්වත් ඇති කළ නොහැක. ඔවුන්ට තත්පරයක්වත් නිෂ්ඵල ආකල්පයක් තිබිය නොහැක, මන්ද වාතාවරණය නිර්මාණය වන්නේ ඔවුන්ගේ ආකල්පයෙනි, එබැවින් ඔවුන් තුළ ඉබේටම සියලු දෙනා කෙරෙහි සුබ පැතුම් සහ පිවිතුරු හැඟීම් ඇතිවෙයි.

**පාඨය:** නොදැනුවත්කමේ බලය, කෝපය වන අතර, දැනුමේ බලය, සාමයයි.

***** ඔම ශාන්ති *****